# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2204/2 - 2020 නොවැම්බර් මස 30 වැනි සඳුදා - 2020.11.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට බඩල්කුඹුර ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ අලුපොත භූගත ජල ටැංකිය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

2020 නොවැම්බර් මස 10 වැනි දින,
යොමු අංකය : 5/4/MJ/1,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැඳුර",
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

1A - G 33289 — 53 (2020/11)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**උපලේඛනය**

මොණරාගල දිස්ත්‍රික්කයේ, බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 132, අලුපොත ග්‍රාම නිලධාරි වසමේ අලුපොත ගමේ පිහිටි මේ සමග එවන බලයලත් මිනින්දෝරු පී. පෙරින්පනාතන් මහතා විසින් 2019.06.24 දිනින් අඳින ලද අංක 2202 සැලැස්මේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ඔසිල්ලාකිවුල නමැති සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 10ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| උතුරට | : | ඒ. එස්. ඒ. හනී හිමිකම් කියන ඉඩම ; |
| නැගෙනහිරට | : | මාර්ග රක්ෂිතය ; |
| දකුණට | : | එම්. එච්. එම්. සම්හුන් හිමිකම් කියන ඉඩම ; |
| බටහිරට | : | ඒ. එස්. ඒ. හනී හිමිකම් කියන ඉඩම. |

ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනය : 01. ඒ. එස්. ඒ. හනී,
ඔසිල්ලාකිවුල, අලුපොත,
බඩල්කුඹුර.

12 - 158

---

ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, 2019.02.28 දිනැති අංක 2112/41 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 1A පිටුවේ හා 2A පිටුවේ අංක 03 - 767 යටතේ පළ කරන ලද නිවේදනයේ ඉඩමට මායිම් ලෙස

| | | |
|---|---|---|
| පිඹුරු අංක | : | එෆ්සීපී පො 13හි පත්‍ර අංක 52හි, අතිරේක අංක 40 දරන සැලැස්මේ කැබලි අංක 1049න් කොටසක් |
| උතුරට | : | කැබලි අංක 1049 දරන මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| නැගෙනහිරට | : | කැබලි අංක 1049 දරන මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| දකුණට | : | කැබලි අංක 1049 දරන මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| බටහිරට | : | කැබලි අංක 1795 දරන ඉඩම් කොටස. |

ලෙස දක්වා ඇතත් එය,

| | | |
|---|---|---|
| පිඹුරු අංක | : | FCP පො 13හි පත්‍ර අංක 52හි, අතිරේක අංක 40 දරන පිඹුරේ කැබලි අංක 925න් කොටසක් |
| උතුරට | : | කැබලි අංක 925 දරන මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| නැගෙනහිරට | : | කැබලි අංක 924 දරන මෙම ඉඩම් කොටස ; |
| දකුණට | : | කැබලි අංක 926 දරන මෙම ඉඩම් කොටස ; |
| බටහිරට | : | කැබලි අංක 925 දරන මෙම ඉඩමේ ඉතිරි කොටස. |

ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 21 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැඳුර",
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
5/2/1/1433

12 - 159

ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, 2019.10.11 දිනැති අංක 2144/62 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 1A පිටුවේ අංක 10-956 යටතේ පළ කරන ලද නිවේදනයේ, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, "විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතියේ, රත්තොට ජල පොම්පාගාරය හා ප්‍රවේශ මාර්ගය ඉදි කිරීම සඳහා විකල්ප ඉඩම් කොටස් අත්කර ගැනීම" වශයෙන් සඳහන්ව වුවත්, එය "විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතියේ, රත්තොට ජල පොම්පාගාරය හා ප්‍රවේශ මාර්ගය ඉදි කිරීම සඳහා ඉඩම් කොටස් අත්කර ගැනීම" ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 10 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
5/2/1/1503

12 - 160

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.